ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# භාෂා පරිවර්තක තනතුර (ඉංග්‍රීසි-සිංහල)/(ඉංග්‍රීසි-දෙමළ) (කොන්ත්‍රාත් පදනම මත)

## 1.0 රැකියාව/ රැකියාවේ වගකීම් :

ශ්‍රී ලංකා මහ බැංකුවේ තාක්ෂණික කාර්ය මණ්ඩලය හා ක්ෂේත්‍රයේ විශේෂඥයින් සමඟ සමීපව කටයුතු කිරීම, භාෂා පරිවර්තනය සඳහා යොදා ගනු ලබන නව මෙවලම් භාවිතයන් උපයෝගී කර ගැනීම, පවරනු ලබන සියලුම පරිවර්තන කටයුතු (ඉංග්‍රීසි භාෂාවෙන් සිංහල/දෙමළ භාෂාවට හෝ සිංහල/දෙමළ භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට) සිදු කර, සෝදුපත් කියවීම සහ සුදුසු තාක්ෂණික පාරිභාෂික යෙදුම් භාවිතා කර ප්‍රකාශන මට්ටම දක්වා අදාළ පරිවර්තන කටයුතු සම්පූර්ණ කිරීම භාෂා පරිවර්තකයන්ගෙන් අපේක්ෂා කෙරෙයි.

## 2.0 අවශ්‍ය අවම සුදුසුකම් සහ පළපුරුද්ද:

### 2.1 අධ්‍යාපනික සුදුසුකම් සහ පළපුරුද්ද:

ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් භාෂා පරිවර්තනය පිළිබඳ විශේෂවේදී උපාධිය (ඉංග්‍රීසි-සිංහල-ඉංග්‍රීසි හෝ ඉංග්‍රීසි-දෙමළ-ඉංග්‍රීසි)

**හෝ**

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් ප්‍රථම උපාධියක් සමග ශ්‍රී ලංකා මහ බැංකුවට පිළිගත හැකි ආයතනයක භාෂා පරිවර්තකයෙකු ලෙස වසර 02 ක පළපුරුද්ද

**හෝ**

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා මහ බැංකුවට පිළිගත හැකි ආයතනයකින් ලබා ගත් භාෂා පරිවර්තනය පිළිබඳ ඩිප්ලෝමාවක් සමග ශ්‍රී ලංකා මහ බැංකුවට පිළිගත හැකි ආයතනයක භාෂා පරිවර්තකයෙකු ලෙස වසර 04 ක පළපුරුද්ද.

## 3.0 වයස :

2024.10.16 දිනට අවුරුදු 55 හෝ ඊට අඩු විය යුතුය.

**අයදුම්පත සමග අධ්‍යාපනික සුදුසුකම් සහ සේවා පළපුරුද්ද සනාථ කිරීමට අදාළ සහතිකවල ඡායා පිටපත් යොමු කිරීමට අයදුම්කරුවන් විසින් වග බලා ගත යුතුය. ඉහත ලියකියවිලිවල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවක දී ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.**

## 4.0 රැකියාව :

වසර තුනකට (03) නොවැඩි කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනේ. ආරම්භයේ දී වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කරනු ලබන අතර, එක් එක් වසර අවසානයේ දී කාර්ය සාධනය මත පදනම්ව ගිවිසුම දීර්ඝ කිරීමට සලකා බලනු ඇත.

## 5.0 වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ :

රු. 125,000 ක (බදු ගෙවිය යුතු) මාසික දීමනාවක්, සාමාන්‍ය කාර්යාල වේලාවෙන් පරිබාහිරව වැඩ කරන අමතර පැය සඳහා දිරි දීමනාවක් සහ සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා දායකත්වය

## තෝරා ගැනීමේ ක්‍රමවේදය

පරිවර්තන හැකියාව හා පරිගණක භාවිතය සම්බන්ධ කුසලතා තක්සේරු කිරීම සඳහා පවත්වනු ලබන නිපුණතා පරීක්ෂණයක් සහ මේ සම්බන්ධයෙන් පවත්වන ලබන සම්මුඛ පරීක්ෂණයක් මත පදනම්ව සුදුසු අපේක්ෂකයින් තෝරා ගනු ලැබේ.

## අයදුම්පත්

අයදුම්පතෙහි නියමිත ආකෘති පත්‍රය, https://www.cbsl.gov.lk/en/careers යන ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියෙන් ලබා ගත හැකි ය. නියමිත ආකෘතියට අනුව සකස් කළ අයදුම්පත් පමණක් ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් වග බලා ගත යුතු අතර සියලු ලිපි ලේඛන සහිතව නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2024.10.16 දින හෝ ඊට පෙර අධ්‍යක්ෂ/මානව සම්පත් වෙත ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු ය. අයදුම්පත් එවීමේදී **"භාෂා පරිවර්තක තනතුර (ඉංග්‍රීසි-සිංහල) (කොන්ත්‍රාත් පදනම මත)"** හෝ **"භාෂා පරිවර්තක තනතුර (ඉංග්‍රීසි-දෙමළ) (කොන්ත්‍රාත් පදනම මත)"** යනුවෙන් අදාළ පරිදි ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතු ය.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අදාල සුදුසුකම් සහ සේවා පළපුරුද්ද සම්පූර්ණ කර නොමැති තැනැත්තන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබන අතර අවශ්‍ය සුදුසුකම් සහ සේවා පළපුරුද්ද සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී අදාළ සහතිකපත්‍රවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන් කවර හේතුවක් යටතේ හෝ මෙම තනතුර සඳහා සුදුසුකම්ලත් අපේක්ෂකයන් වශයෙන් සලකනු නොලැබේ. තෝරා ගැනීම සඳහා කුමන ආකාරයකින් හෝ බලපෑම් කිරීම හෝ එසේ කිරීමට තැත් කිරීම බඳවා ගැනීම සඳහා නුසුදුසුකමක් වේ. බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීම, බඳවා ගැනීම කල් දැමීම හෝ අවලංගු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු ය. බඳවාගැනීමේ නිර්ණායක අනුව සුදුසුකම් ලබන අපේක්ෂකයන් පමණක් බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඊළඟ පියවර සඳහා සලකා බලනු ලැබේ.

**අධ්‍යක්ෂ – මානව සම්පත්**
**ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01.**
**දුරකථනය : 011-2477330 ෆැක්ස් : 011-2477715**